සියලුම ම හිමිකම් ඇවිරිණි]

All Rights Reserved]

කලාප අධ්‍යාපන කාර්යාලය - ගම්පහ

විකසිත - 2024

5 ශ්‍රේණිය සිසුන් සඳහා විභව්‍යතාමාන ඇසුරෙන් සැකසූ මාසික ඇගයීම් වැඩසටහන)

පැය එකයි

නම - ..... ශ්‍රේණිය - .....

විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස් :-


- ඔබගේ විභාග අංකය මේ කොටුව තුළ ඇති හිස් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රත්න 40 ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු තුන බැගින් දී ඇත. ඒවා අතුරෙන්, එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අදින්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.

පිටු අංකය	ලැබූ ලකුණු
02	
03	
04	
05	
06	
07	
08	
එකතුව	
අවසාන ලකුණ	
ඉලක්කමෙන්	
අකුරෙන්	

	කෙටි අත්සන හා සංකේත අංකය
පළමු පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බව සහතික කරමි.	V/I/S
දෙවන පක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි.	V/I/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි.	V/I/S/EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය.	V/I/S/CH

01. පහත රූප සටහන පිළිබඳ නිවැරදි ම ප්‍රකාශය කුමක් ද?



1. සරුංගල් තුනක් හා ළමයින් පස් දෙනෙක් ඇත.
2. ගෙවිලිය ඇඹුල ගෙන එන අතර ගොවියෝ කුඹුරෙන් ගොඩට පැමිණෙති
3. කුරුල්ලෝ පස් දෙනෙක් පියාඹන අතර උදලු තුනක් ඇත.

02. B ස්ථානයේ දැකිය නොහැකි සතුන් වන්නේ,

1. මාළුවා, මැඩියා
2. කොකා, දිය නයා
3. හාවා, ලේනා

03. පහත සඳහන් කවියේ හිස්තැන් සඳහා වඩාත් සුදුසු වචන පිළිවෙළින් ඇතුළත් පිළිතුර තෝරන්න.

මල්වල ..... පැනී
ඇද බොන බඹරා මෙනී
හොඳ ළමයා නුවණී නී
..... දේ තෝරා ගනී

1. හොඳ, සුමිහිරි
2. හොඳ, බොහෝ
3. සුමිහිරි, හොඳ


04. සිඟා කාගෙන වත්
කිලුටු වැරහැලි ඇඳිවත්
බිම වැටී ඉඳ වත්
මහත් සැප වෙයි ඉගෙන ගතහොත්

මෙම කවියේ අදහස වඩාත් හොඳින් අදහස් වන්නේ

1. දුක් විඳිමින් ඉගෙන ගැනීමෙන් ප්‍රයෝජනයක් නොමැති බව
2. මිල මුදල්, හොඳ ඇඳුම් නොමැතිව අධ්‍යාපනය ලැබිය නොහැකි බව
3. සියලු දුක් ඉවසා ගෙන ඉගෙන ගැනීමේ ඇති වටිනාකම


05. 2012 වර්ෂයේ පෙබරවාරි 12 සඳුදා දවසක් නම් මාර්තු 8 දවස කවදා ද?

1. බදාදා
2. බ්‍රහස්පතින්දා
3. සිකුරාදා

06. 

මෙවැනි ගඩොල් ගොඩවල් 4 ක ඇති ගඩොල් ගණන වන්නේ,


1. 6
2. 12
3. 24

07. 

පහත රූප සටහන දෙස බලා ඒ හා සම්බන්ධ නොවන පිළිතුර තෝරන්න.

1. පෙ.ව. 8.30
2. පෙ.ව. 9.00
3. ප.ව. 4.30

08. පහත ඝන වස්තුව තිත් ඉරි දිගේ කපා ගත් පසු A හා B කොටස් දෙක සම්බන්ධ නිවැරදි පිළිතුර තෝරන්න.



1. B කොටසේ හා A කොටසේ ශීර්ෂ ගණන සමාන ය.
2. A හා B කොටස්වල දාර ගණන සමාන ය.
3. A කොටසේ දාරවලට වඩා B වල දාර ගණන වැඩි ය.


09. නිමල් පන්තියේ හෝ පාසලේ පැවැත්වෙන සෑම කාර්යකදී ම කුමක් හෝ හේතුවක් පවසා පාසලට නොපැමිණීම ඔහුගේ සිරිතකි. එය හැඳින්වීමට වඩාත්ම සුදුසු යෙදුම වන්නේ,

1. අහසේ මාලිගා හදනවා
2. ඇඟ බේරා ගැනීම
3. මුරුංගා අත්තේ තියනවා.

10. ගමනකින් 4/6 ක් ඇවිද ගිය පසු තවත් 12km ක් ඉතිරි වී ඇත. ගමනේ මුළු දුර සොයන්න.

1. 24km
2. 36km
3. 48km


11. පහත ඇත්තේ සමචතුරස්‍ර 5 කි. එම රූපය වටේ දිග 144cm කි. මෙහි එක මුහුණතක් වැසීමට 1cm ක් දිග හා පළල කුඩා සමචතුරස්‍ර කීයක් අවශ්‍ය ද?



1. 12
2. 144
3. 24

12. ඔරලෝසු මුහුණතක මිනිත්තු කටුව එක් සංඛ්‍යාංකයක සිට ඊට ප්‍රතිවිරුද්ධ සංඛ්‍යාංකයට ගමන් කිරීමේ දී අතරමැද පසු කරන ඉලක්කම් ගණන වන්නේ,

1. 6 2. 7 3. 5


13. 

ඔබ සතුව ඉහත ආකාරයේ කුඩා ඝනක 40 ක් තිබේ නම් එම ඝනක එකතු කර විශාල ඝනකයක් සෑදීමට ඉවත් කළ යුතු ඝනක ගණන කීය ද?

1. 12 2. 13 3. 14

14. රැස්වීම් ශාලාවක ඇති ආසන 301 සිට 500 තෙක් අංක කර ඇත. ඒවා අතරින් 3 සහ 5 ඉලක්කම් එක ළඟ යෙදෙන අංක සහිත ආසන කීයක් තිබේ ද?

1. 11 2. 12 3. 13


15. 

මෙම රූපයේ අඳුරු කර ඇති කොටස් දැක්වෙන භාගය නොවන්නේ,

1. 1/2 2. 4/8 3. 5/8

16. නැටුම් ගුරුතුමියට සීතා නීතා ගීතා විනීතා හා සුනීතා යන ශිෂ්‍යාවන් අතරින් දෙදෙනකු නැටුමකට තෝරා ගත හැකි එකිනෙකට වෙනස් ආකාර කීයක් තිබේ ද?

1. 20 2. 10 3. 15



17. 

නගර හතරක පිහිටීම පහත දැක්වේ

- A සිට D දක්වා දුර 160km
- B සිට C දක්වා දුර 36km
- C සිට D දක්වා දුර 42km

නිමල් A සිට C දක්වා ගමන් කර නැවත B නගරයට පැමිණියේ නම් නිමල් ගමන් කර ලද මුළු දුර කොපමණ ද?

1. 118km 2. 154km 3. 78km

18.  

ඉහත රූප දෙක පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.


1. මෙම රූප දෙකේ නිවැරදිව සමමිතික රේඛා ඇඳ ඇත.
2. වෘත්තයේ නිවැරදිව සමමිතික රේඛා ඇඳ ඇත.
3. සමචතුරස්‍රයේ සමමිතික රේඛා සියල්ල ඇඳ ඇති අතර වෘත්තයේ තවත් සමමිතික රේඛා ඇඳිය හැකිය.

19. පොතක පිටු 138ට පසු පිටු ගැළවී ගොස් තිබූ අතර නැවත පිටු ආරම්භ වූයේ 153 පිටුවේ සිටය. ඒ අනුව පොතේ ගැළවී ගොස් ඇති පිටු ගණන වන්නේ,

1. පිටු 15 2. පිටු 16 3. පිටු 14

20. නිමාලි තමා ළඟ තිබූ මුදලින් 1/4 ක් තමාලිට දුන්නා ය. තමාලි තමාට ලැබුණු මුදලින් 1/2 ක් සීතාට දුන්නා ය. සීතාට ලැබුණු මුදල රු. 150 ක් නම් නිමාලි ළඟ තිබූ මුදල කීය ද?

1. රු. 300 2. රු. 600 3. රු. 1200

21. 


රූපයේ දැක්වෙන්නේ චතුස්තලයක, මුහුණතක් පිහිටා ඇති ආකාරයයි. එහි අනෙක් මුහුණත් වලද මේ අයුරින්ම ඉලක්කම් ලියා ඇත. එසේ නම් මුහුණත් සියල්ලේ ඇති ඉලක්කම්වල එකතුව කීය ද?

1. 112 2. 28 3. 84

22. පහත දැක්වෙන වාක්‍යයේ හිස්තැන් දෙක සම්පූර්ණ කිරීම සඳහා වඩාත් සුදුසු වචන යුගලය කුමක් ද?

ළහිරු රැසින් ..... දිය ඇති නදියෙහි ..... තැනක් රිදී කඳක් සේ සිත් ගනියි.

1. දිලිසෙන, වෙනත් 2. නැළවෙන, තවත් 3. බැබළෙන, ඇතැම්

23. 

මෙම රූපය තුළ දැකිය හැකි සෘජුකෝණ ගණන කීය ද?

1. 14 2. 15 3. 16


24. ඔරලෝසුවක පැය කටුවත් මිනිත්තු කටුවත් අතර කෝණය සෘජුකෝණයට වඩා අඩුවෙන් සහ වැඩියෙන් පිහිටන අවස්ථා දෙක අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. පෙ.ව. 9.00, පෙ.ව. 3.00 2. පෙ.ව. 2.00 පෙ.ව. 7.00 3. පෙ.ව. 1.00 පෙ.ව. 10.00

25. පන්තියක සිටින ළමුන් 14 දෙනෙක් සමාන පරතරය සහිතව වෘත්තාකාර මේසයක් වටා සිටගත් විට 5 වන සිසුවාට ඉදිරියෙන් සිටින්නේ කී වෙනි සිසුවා ද?

1. 10 වෙනි සිසුවා 2. 12 වෙනි සිසුවා 3. 11 වෙනි සිසුවා


26.



රටාව අනුව ? ලකුණට ගැළපෙන සංඛ්‍යාවකීය ද?

1. 26 2. 19 3. 29

27.




දී ඇති කොටු දැලෙහි ආරම්භක කොටුවේ සිට අවසාන කොටුව තෙක් කොටු දැල තුළින් යා යුත්තේ අඳුරු කර ඇති කොටු මග හරිමිනි. කෙටිම මාර්ගයෙන් එසේ යාමේ දී අතර මග කොටු කීයක් පසු කිරීමට සිදුවේ ද?

1. 9 2. 10 3. 11

28. ගුරුතුමිය ළඟ තිබූ ටොෆි 116 ක් සමානව ළමයින් 8 දෙනෙකුට බෙදා දුන් පසු තවත් 20ක් ඉතිරි විය. එක් ළමයෙකුට ලැබුණු ටොෆී ගණන කීය ද?

1. 12 2. 14 3. 16


29.



මෙම රූපයේ සමචතුරස්‍ර ගණන කීය ද?

1. 8
2. 6
3. 10

30. හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.



1. 20 2. 60 3. 30

31. යම් වැඩක් නිම කිරීමට මිනිසුන් පස් දෙනෙක් හා ළමයි තුන් දෙනෙකුට දින පහක් ගතවේ. එක මිනිසෙක් අසනීප වී නොපැමිණියේ නම් එම වැඩය නිම කිරීම සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.


1. එක් මිනිසෙක් වෙනුවට ළමයි දෙදෙනෙක් යොදා ගැනීම
2. එම වැඩය නිම කිරීමට දින තුනක් ගතවේ.
3. එම පිරිසට දින පහකින් එම වැඩය නිම කළ නොහැකි වෙයි.

32. ක්‍රීඩකයෙකුට සතියක් නොකඩවා පුහුණුවීම් කළ යුතු බව පුහුණුකරු දැනුම් දුන්නේ ය. ක්‍රීඩකයා පුහුණුව ආරම්භ කළ දිනය 17 වන බදාදා නම් පුහුණුව අවසන් කරන දිනය වන්නේ,

1. 24 වන බදාදා
2. 18 වන බ්‍රහස්පතින්දා
3. 23 වන අඟහරුවාදා

33. පොතක ඇති පිටු සංඛ්‍යාව 110 කි. එහි මැද පිටු දෙකේ අංක වන්නේ,

1. 54 හා 55
2. 56 හා 57
3. 55 හා 56

34. 

සමචතුරස්‍ර කඩදාසියක මුළු හතරේ අඳුරු කර ඇති කොටස් හතර කපා ඉවත් කළ විට ඉතිරිවන කොටසේ වටේ දිග මුලින් තිබූ කඩදාසියේ වටේ දිගට

1. වඩා අඩුය
2. සමානය
3. වඩා දිගය

35. පොකුණක සෑම උදය ම නෙලුම් මල් 5 ක් පිපෙන අතර සවසට ඉන් 2 ක් පරවී යයි. පොකුණෙහි නෙලුම් මල් 20 ක් දැකගත හැකි වන්නේ කවදා ද?


1. 5 වන දින
2. 6 වන දින
3. 8 වන දින

36. 1 සිට 20 තෙක් ඇති සියලුම සංඛ්‍යාවල එකතුව කීය ද?

1. 220
2. 210
3. 230

37. නූලක් ගෙන සමාන කොටස් 3 ක් ලැබෙන සේ නමා ඉන් පසු එය ස්ථාන දෙකකින් කැපූ විට ලැබෙන කුඩා නූල් කැබලි ගණන කීය ද?


1. 6
2. 8
3. 7

38. 


රූපයේ දැක්වෙන්නේ සමචතුරස්‍රාකාර ඉඩමකි. එහි සෑම පැත්තේම හරි මැදින් පොල් ගසක් සිටුවා ඇත. එක් පොල් ගසක සිට අනෙක් පොල් ගසට ඇති දුර කොපමණ ද?

1. 3m 25cm
2. 13m
3. 6m 50cm

39. සමචතුරස්‍රවලින් සාදා ඇති පහත රූප දෙක සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.



A



B

1. A රූපයට වඩා B රූපයේ දිග අඩුය.
2. A හා B රූප දෙකේ වටේ දිග සමාන ය.
3. A රූපයට වඩා B රූපයේ වටේ දිග වැඩිය.

40. අධික අවුරුද්දක ජනවාරි සිට ජුනි තෙක් ඇති මාසවල ඇති දින ගණනේ එකතුව දෙකෙන් බෙදූ විට පිළිතුර වන්නේ,

1. 182
2. 181
3. 91